# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
# (PGIM)
# කොළඹ විශ්වවිද්‍යාලය

## ක්‍රමලේඛන සහ පද්ධති විශ්ලේෂක තනතුර - II ශ්‍රේණිය

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ක්‍රමලේඛන සහ පද්ධති විශ්ලේෂක තනතුර - II ශ්‍රේණිය සඳහා යෝග්‍ය සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් 2026.02.06 දින තෙක් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ක්‍රමලේඛන සහ පද්ධති විශ්ලේෂක - II ශ්‍රේණිය - තනතුර 01

**වැටුප් කේතය** : (U-AS-2(II)

**වැටුප් පරිමාණය** : රු. 85,305 - 3X2,400 - 92,505(EB) 94,905-14X2,400-128,505, 2025.01.01 දිනට මාසිකව

**වෙනත් ප්‍රතිලාභ**

- ජීවන අංක දීමනාව රු. 17,800.00
- තෝරාගත් අයදුම්කරුවන්හට 2025.04.04 දිනැති අංක 02/2025(i) දරන කොමිෂන් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රමලේඛන සහ පද්ධති විශ්ලේෂක - II ශ්‍රේණිය තනතුරට අදාළ වෙනත් දීමනා ගෙවනු ලැබේ.
- සේවා යෝජකයා විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත 3% බැර කෙරේ.
- සේවක වැටුපෙන් 10% ක් සහ සේවා යෝජකයා විසින් 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල වෙත බැර කෙරේ.
- වැටුපෙන් 8% ක ප්‍රමාණයක් සේවා යෝජකයා විසින් විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ.

අයදුම්පත් සහ අනිකුත් විස්තර ආයතනයේ වෙබ් අඩවිය වන https://pgim.cmb.ac.lk වෙතින් බාගත කරගත හැක. නිර්දේශිත ආකෘතියෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතික පිටපත් සමග 2026.02.06 දින හෝ ඊට පෙර recruitment@pgim.cmb.ac.lk විද්‍යුත් තැපැල් ලිපිනයට ඉදිරිපත් කිරීම හෝ කොළඹ 07, මහාචාර්ය නන්දදස කෝදගොඩ මාවත, නො. 160, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ලේඛකාධිකාරී, ආයතනික සහ සාමාන්‍ය පරිපාලන අංශය වෙත ගෙනවිත් භාරදීම හෝ ලියාපදිංචි තැපැල් මගින් එවීම සිදුකළ යුතුය. අයදුම් කරනු ලබන තනතුර විද්‍යුත් තැපැල් ලිපියෙහි ශීර්ෂ තීරුවෙහි හෝ ලිපි කවරයෙහි වම් ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය.

උසස් අධ්‍යාපන ආයතන, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් අදාළ අංශ ප්‍රධානීන් මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවය හා අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අසම්පූර්ණ අයදුම්පත් හෝ සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකවල ඡායා පිටපත් ඇතුලූ අවශ්‍ය විස්තර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාරගැනීමට නියමිත දිනයෙන් පසු කරනු ලබන අයදුම්පත් ඉදිරිපත් කිරීම් භාරනොගන්නා අතර ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් කිසිදු හේතුවක් මත සලකා බලනු නොලැබේ.

**අධ්‍යක්ෂ, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**
**2026.01.18**